රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක: 05

මගේ අංකය: ආ/9/2/1/136
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2008 ජුලි මස 28. වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සංස්ථා සභාපතිවරුන් සහ
ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන් වෙත.

**<u>වැඩිහිටි හැඳුනුම්පතට ප්‍රමුඛතාවය ලබා දීම.</u>**

ශ්‍රී ලංකාව දකුණු ආසියාතික කලාපයේ සීඝ්‍රයෙන් වැඩිහිටි ජනගහනය වර්ධනය වන රටක් වන අතර වර්තමාන මුළු ජනගහනයෙන් වැඩිහිටි ජනගහනය 10% ක් වේ.

02. වැඩිහිටි පුද්ගලයන්ට ඔවුන්ගේ විවිධවූ සේවා අවශ්‍යතාවන්හිදී ප්‍රමුඛතාවය දීමේ අරමුණ ඇතිව 1999 සිට මේ දක්වා සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් වැඩිහිටි හැඳුනුම්පතක් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් නිකුත් කිරීමට විධිවිධාන සලස්වා ඇත.

03. වයස අවුරුදු 60 ඉක්මවූ වැඩිහිටි පුද්ගලයන් සඳහා සේවා සැපයීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. ආයතන මගින් සේවා සැපයීමේදී වැඩිහිටි හැඳුනුම්පත්ලාභීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.

II. වැඩිහිටි පුද්ගලයන්ට සේවා ලබා ගැනීමට පහසුවන ආකාරයට කාර්යාල සකස් කිරීම.(උදා. කාර්යාලවල විශ්‍රාම වැටුප් අංශ පහළ මහල්හි පිහිටුවීම.)

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

පිටපත: ලේකම්
සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය } කාරුණික දැනගැනීම සඳහා